Additional Study Support Material



CA SRI LANKA CURRICULUM 2015

# KE3
# Fundamentals of Law

## *(Sinhala)*

මෙම අධ්‍යයන අතිරේකය නිර්මාණය කර ඇත්තේ අමතර අධ්‍යයන උපකාරකයක් වශයෙන් භාවිතා කිරීම සඳහාය. අධ්‍යයන ග්‍රන්ථයේ ඉදිරිපත් කළ අන්තර්ගතය පිළිබඳ විමසමින් එහි අදාළ එක් එක් පරිච්ඡේදය යටතේ මෙම අතිරේක අධ්‍යයන උපකාරකයේ සඳහන් කරුණු පරිශීලනය කරන්න. “KE 3–Fundamentals of Law” අධ්‍යයන ග්‍රන්ථය මිලදීගත් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් ද මෙම අතිරේක අධ්‍යයන උපකාරකය පරිශීලණය කළ යුතුය.

# පටුන

## KE3 Fundamentals of Taxation and Law

### Part B – Fundamentals of Law


| | |
|---|---|
| 1 ශ්‍රී ලංකාවේ නීතිය සහ නියාමක රාමුව පිළිබඳ හැඳින්වීම | 03 |
| 2 ගිවිසුම් නීතිය (මූලික දැනුම) | 08 |
| 3 භාණ්ඩ විකිණීම (මූලික දැනුම) | 11 |
| 5 නියෝජ්‍යත්ව නීතිය | 13 |
| 6 හවුල් ව්‍යාපාර නීතිය | 17 |
| 7 රක්ෂණ නීතිය | N/A |
| 8 කුලී සින්නක්කර, කල් බදු සහ ණය | 21 |
| 9 කම්කරු නීතිය | 24 |
| 10 ව්‍යාපාරික පරිසරය සහ නව රෙගුලාසි වලට අදාළ වන වැරදි | 26 |
| 11 අන්තර්ජාතික වෙළඳාම | 32 |



All Rights Reserved 

# පරිච්ඡේදය 1 - අතිරේක අන්තර්ගතය සහ සංශෝධන

## ශ්‍රී ලංකාවේ නීතිය සහ නියාමක රාමුව පිළිබඳ හැඳින්වීම

**මාතෘකාව : 3.6.1 ශ්‍රී ලංකාවේ විධිමත් අධිකරණ සංයුතිය**
**පිටු අංක : 14**

*ශ්‍රී ලංකාවේ අධිකරණ ව්‍යුහය පිළිබඳ දී තිබෙන රූප සටහනේ ('අභියාචනාධිකරණය' හා 'මහාධිකරණය' යන වචන දෙක අතර වූ කොටුවේ අන්තර්ගත) 'සිවිල් අධිකරණ බලය' නමැති වචනය ඉවත්වියයුතු අතර 'අපරාධ අධිකරණ බලය' යන වචනය ('අභියාචනාධිකරණය' හා 'වාණිජ මහාධිකරණය' යන වචන දෙක අතර වූ කොටුවේ අන්තර්ගත) ඉවත් කළ යුතුය. ඒ වෙනුවට පහත රූප සටහන ආදේශ වේ.*





All Rights Reserved

**මාතෘකාව : 3.6.2 අධිකරණ පද්ධතිය තුල විවිධ නඩු සම්බන්ධයෙන් අභියාචනා කිරීමේ ධූරාවලිය**
**පිටු අංක : 16**

*පහත වගන්තියේ 'රු. මිලියන 3' යන්න 'රු. මිලියන 5' ලෙස නිවැරදි විය යුතුවේ.*

- වාණිජ ගනුදෙනු රුපියල් **මිලියන 5** ඉක්මවා යන්නේ නම් අධිකරණ සංයුතිය,




**මාතෘකාව : 3.6.3 ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධිකරණ**
**පිටු අංක : 18,19,20**

*'වාණිජ මහාධිකරණය' යන මාතෘකාව යටතේ දක්වා ඇති ඡේදවල රු. මිලියන 3 යන්න පහත පරිදි රු. මිලියන 5 ලෙස වෙනස් වියයුතු අතර එම ඡේද පහත පරිදි සංශෝධන විය යුතුය.*

**වාණිජ මහාධිකරණය**

වාණිජ මහාධිකරණය යනුවෙන් හැඳින්වෙන මහාධිකරණය මෑතකදී කොළඹ පිහිටුවනු ලැබූ අතර දිස්ත්‍රික් උසාවිවල ගොඩගැසී තිබුණු විශාල නඩු ප්‍රමාණයක් අඩුකිරීම එය පිහිටුවීමේ පරමාර්ථය විය.

මෙම අධිකරණය 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත යටතේ පිහිටුවන ලදී. මෙම පනත මගින් මෙකී අධිකරණවලට සමහර සිවිල් නඩු විභාග කිරීමේ හා තීරණය කිරීමේ අධිකරණ බලය ලබාදී ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 'ග' වගන්තිය දිවයින තුළ පළාත්බද මහාධිකරණ පිහිටුවීම සඳහා වූ විධිවිධාන සලස්වා ඇත. මෙම වගන්තිය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් හඳුන්වාදෙනු ලැබූ අතර ඒ ඒ පළාත්වල ඒ අනුව පළාත්බද මහාධිකරණ පිහිටුවන ලදී. විශේෂයෙන් හඳුනාගනු ලැබූ සමහර සිවිල් කරුණු සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා මහාධිකරණය වෙත බලය පවරමින් පාර්ලිමේන්තුව විසින් 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධාන) පනත සම්මත කරන ලදී. ඉහළ වාණිජ අගයක් ගන්නා කරුණු සම්බන්ධයෙන් වන මතභේද , බුද්ධිමය දේපල පනත යටතේ ගැනෙන නඩු සහ සමාගම් පනත යටතේ ගැනෙන සමහර නඩු මේ යටතේ ආවරණය වේ.

All Rights Reserved 

දේශීය හා ජාත්‍යන්තර යන ක්ෂේත්‍රයන් දෙකෙහිම ව්‍යාපාරික ගනුදෙනු ඉහළයාම හේතුවෙන් මෙම අධිකරණය පිහිටුවීමේ අවශ්‍යතාවය මතුවිය. වාණිජ ලෝකය තුළ උද්ගතවන ආරවුල් නිරාකරණය කිරීම සඳහා පැහැදිලි හා කඩිනම් ක්‍රියාවලියක් නොමැති නම් වාණිජ කටයුතු නිසිලෙස ක්‍රියාත්මක වීම සිදුනොවනු ඇත.

පනතට අනුව වාණිජ ගනුදෙනු හේතුකොට ගෙන නඩු නිමිත්ත පැනනගින ඕනෑම නඩුවක (බැංකු, භාණ්ඩ, ආනයන හා අපනයනය, සේවා කඩකිරීම, රක්ෂණය, වාණිජ නියෝජ්‍යත්වය, වාණිජ භාවිතය සහ යම්කිසි වාණිජ ලියවිල්ලක් සකස් කිරීම ආදිය මත පැන නැගෙන නඩු ද ඇතුලත්ව) ණය, අලාභය හෝ වන්දි ඉල්ලීම රුපියල් මිලියනයක ප්‍රමාණය හෝ ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයක් මාර්ගයෙන් කලින් කල නියම කරනු ලබන යම් වෙනත් ප්‍රමාණයක් ඉක්මවයි නම් එකී නඩු සම්බන්ධ අධිකරණ බලය වාණිජ මහාධිකරණ සතුවේ. එහෙත් 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත් යටතේ ගැනෙන නඩු ඊට අයත් නොවේ.

මේ අනුව මෙම ප්‍රතිපාදනය යටතේ නඩු පැවරීමට එය **රුපියල් මිලියනයකට වඩා වැඩි වටිනාකමින් යුක්ත** වාණිජ ගනුදෙනුවක් හේතුවෙන් පැන නගින මතභේදයක් විය යුතුය. කෙසේ වෙතත් මෙම අධිකරණය ක්‍රියාත්මක වීමට හා ආරම්භ වීමට හා පෙර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගයක් මගින් ඉහත සඳහන් වටිනාකම රුපියල් **මිලියන 5** දක්වා වැඩි කෙරිණ.

මෙම පනත යටතේ නඩු පැවරීම කරන නීතිඥයන් මෙම කරුණ, එනම් වාණිජ ගනුදෙනුවේ වටිනාකම ඉතා තදින් සිහියේ තබාගත යුතුය. නඩුවේ වටිනාකම පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන අයැදුම අනුව තීරණය වනනිසා නඩු වටිනාකම නිර්ණය කිරීමේ ගැටලුවක් පැන නොනගී.

අධිකරණ බලය පිළිබඳ ප්‍රශ්නය පැන නගින අනෙක් අවස්ථාව නම් වගඋත්තරකරුගේ හරස් ඉල්ලීම රුපියල් **මිලියන 5** ඉක්මවන අවස්ථාවන්ය. පැමිණිලිකරුගේ හිමිකම්පෑම රුපියල් **මිලියන 5** ඉක්මවා නොවන එකක් නම් නඩුව ගොනුකොට පවත්වාගෙන යා යුත්තේ දිසා අධිකරණයේය.

එවැනි අවස්ථාවක වග උත්තරකරුගේ හරස් ඉල්ලීම රුපියල් **මිලියන 5** ඉක්මවුවද නඩුව දිගටම දිසා අධිකරණයේ පවත්වාගෙන යනු ලැබේ.

ඒනිසා හුදෙක් හරස් ඉල්ලීමේ වටිනාකම රුපියල් **මිලියන 5** ඉක්මවීම මත දිසා අධිකරණයෙන් වාණිජ අධිකරණයට නඩුව මාරු කිරීමට කෙරෙන ඉල්ලීමට ඉඩදෙනු නොලැබේ. මේ බව පළාත්බද මහාධිකරණ පනතේ 8 වන වගන්තියේ පැහැදිලිව දක්වා ඇත. එමනිසා නඩුවක් පැවරීමේ දී නඩුවේ වටිනාකම තීරණය වන්නේ පැමිණිලිකරුගේ හිමිකම් පෑමේ ස්වභාවයි.

වාණිජ මහාධිකරණයේ නඩුවක් පැවරීමට සපුරාලිය යුතු ඊළඟ අවශ්‍යතාවය වන්නේ එය ''වාණිජ ගනුදෙනු'' යන්නට ඇතුළත් වන ආරවුලක් වියයුතු වීමයි. එහෙත් පනතේ ''වාණිජ ගනුදෙනු'' යන්නට අර්ථ නිරූපණයක් සපයා නැත. මෙම කරුණු **කෝනෙල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් එදිරිව මිට්සුයි ඇන්ඩ් කොම්පැනි ලිමිටඩ් සහ තවත් අය** යන නඩුවේදී {ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා අංක 36/98 - මහාධිකරණ සිවිල් අංක 1/98(2)} සාකච්ඡාවට ලක්විය.

All Rights Reserved 

පළාත්බද මහාධිකරණ පනතේ සිංහල හා ඉංග්‍රීසි අනුවාද සසඳමින් මාක් ප්‍රනාන්දු විනිශ්චයකාරවරයා විසින් දෙනලද ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවේදී ''වාණිජ ගනුදෙනුවක්'' යන්නට පුළුල් අර්ථ නිරූපනයක් සපයන ලදී. මෙම නඩුවේදී උගත් මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් නඩුවේ මතභේදයට තුඩුදුන් කරුණු වාණිජ ගනුදෙනුවක් නොවන්නේය යන පදනම මත වාණිජ මහාධිකරණයට එම නඩුව විසඳීමට අධිකරණ බලය නොමැති බවට තීරණය කරන ලදී. එම තීන්දුව අධිතීරණය කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේ එම ගනුදෙනුව පළාත්බද මහාධිකරණ පනතේ දැක්වෙන 'වාණිජ ගනුදෙනු' යන අර්ථය යටතට වැටෙන බවයි.

කෙසේ වෙතත් ''වාණිජ ගනුදෙනුවක්'' යන්න අර්ථ නිරූපණය කිරීමේ ගැටළුව පැනනගින්නේ ගනුදෙනුවේ ස්වභාවය පිළිබඳ සැකයක් මතුවන අවස්ථාවලදී පමණි. ඒ අනුව වටිනාකම රුපියල් **මිලියන 5** කට වඩා වැඩි වුවද ඉඩම් ආරවුලක් වැනි නඩු කල්තියාම විභාග නොකොට ඉවත්කළ හැකි අතර, මෙම අධිකරණය විසින් එවැනි නඩු සලකා බලනු නොලැබේ.

බැලූ බැල්මට වාණිජ ගනුදෙනු ලෙසින් පෙනුනද, 1990 අංක 02 දරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ගොනු කරනු ලබන නඩු ද මෙම අධිකරණයට අදාළ අධිකරණ බලයෙන් නිශ්චිතවම දක්වනු ලැබ ඉවත්කොට ඇත. පළාත්බද මහාධිකරණ පනතේ පළමුවන උපලේඛනයේ මෙම කරුණ පැහැදිලි ලෙසම දක්වා ඇත.

ඒ අනුව මෙම අධිකරණයට අධිකරණ බලය නොමැති කරුණු මුලින් හඳුනා ගත යුතුය. පනතේ පළමුවන උපලේඛනයේ වාණිජ ගනුදෙනු යන්නට අයත් වන කරුණුවල ලැයිස්තුවක් දක්වා ඇත.

මෙම උපලේඛනයේ දක්වා ඇති කරුණු වන්නේ බැංකු, භාණ්ඩ ආනයන හා අපනයන, සේවා සැපයීම කඩකිරීම, රක්ෂණ, වාණිජ නියෝජ්‍යත්වය, වාණිජ භාවිතය සහ වාණිජ ලියවිලි සකස් කිරීම යනාදියයි. මේ අනුව වාණිජ ගනුදෙනුවක් යන්න පැහැදිලි කර ගැනීමට අදාළ මාර්ගෝපදේශයක් ලෙස මෙය යොදාගත හැකිය. මේ අනුව නඩුවේ වටිනාකම හා වාණිජ ගනුදෙනුව යන්න පැහැදිලි ලෙස තේරුම් ගැනීම වාණිජ මහධිකරණයේ නඩුවක් පැවරීමට අවශ්‍ය මූලිකාංග වන බව ඔබට අවබෝධවනු ඇත.

කෙසේ වෙතත් සමාගම් පනත යටතේ පැනනගින කරුණුවලට අදාළ සියලු නඩු වාණිජ මහාධිකරණය ඉදිරියේ ගොනු කිරීම වඩාත් උචිත බව සඳහන් කළ හැකිය.

වාණිජ මහාධිකරණයේ නඩු පවරනු ලබන අනෙක් නඩු විශේෂය වන්නේ 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ පවරන නඩුය. 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනය, 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනතේ අංක 205 දරන වගන්තිය මගින් ඉවත් කර ඇත. ඒ අනුව බුද්ධිමය දේපල පනත යටතේ පවරනු ලබන සියලුම නඩු වාණිජ මහාධිකරණයේ පැවරිය යුතුය.

All Rights Reserved

වාණිජ ගනුදෙනුවක් හේතුවෙන් නඩු නිමිත්තක් පැනනගින සියලුම නඩු මෙම අධිකරණයේ දී විභාග කෙරේ. උදාහරණ:- බැංකු ගනුදෙනු, භාණ්ඩ ආනයනය හා අපනයනය, රක්ෂණ, නියෝජ්‍යත්වය සහ ඕනෑම වාණිජ ලියැවිල්ලක් සකස් කිරීම සම්බන්ධ නඩු. මේවාට අදාළ ණය, වන්දි සහ ඉල්ලීම් **රු. මිලියන 5** ඉක්මවන අවස්ථාවල මෙකී අධිකරණයේ නඩු පවරනු ලැබේ.

තවදුරටත් සමාගම් පනතේ ඇතැම් වගන්ති යටතේ වන සියලු ඉල්ලීම් සහ නඩු කටයුතුවලට අදාළ අධිකරණ බලය මෙන්ම 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යටතේ වන නඩු කටයුතු පවත්වා ගෙන යාමට ද අධිකරණ බලය ඇත. (කොළඹ දිසා අධිකරණයේ දී නඩු කටයුතු පවත්වාගත යුතු බවට පනත විසින් දක්වා ඇති නඩු කටයුතු මේ යටතට නොගැනේ)

All Rights Reserved 

# පරිච්ඡේදය 2 - අතිරේක අන්තර්ගතය සහ සංශෝධන ගිවිසුම් නීතිය (මූලික දැනුම)

**මාතෘකාව : 1.4 ගිවිසුමක ආකෘතිය**
**පිටු අංක : 36**

*ඉහත අනු මාතෘකාව යටතේ එන 3 හා 4 යන කරුණු පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පහත දැක්වේ.*

- 1840 අංක 7 දරන වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වන වගන්තියට අනුව රු. 1000 ක වටිනාකම ඉක්මවන ප්‍රාග්ධනයක් සහිත හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කරන විට, එම හවුල් ව්‍යාපාරය ස්ථාපිත කරන ගිවිසුම හෝ ඔප්පුව ලිඛිත වියයුතු අතර සියලු පාර්ශව විසින් අත්සන් කොට තිබිය යුතුය. 18 වන වගන්තිය මගින් දක්වනු ලබන මෙම කොන්දේසිය තෘප්ත නොවේ නම් එබදු ගිවිසුමකට නීතිය ඉදිරියේ වලංගුතාවයක් නොලැබේ.

- 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ 5 වන වගන්තිය අනුව භාණ්ඩ විකිණීම සඳහා වූ ගිවිසුමක් නීතිය ඉදිරියේ බලාත්මක කළහැකි වීමට නම් පහත දැක්වෙන කොන්දේසි එය විසින් ඉටුකළ යුතුවේ.

  - ගිවිසුම ලිඛිත වීම
  - විකුණන භාණ්ඩවල කොටසක් හෝ ගැණුම්කරු භාරගැනීම හෝ
  - ගැණුම්කරු විකුණුම් මිලෙහි කොටසක් හෝ ගෙවනු ලැබීම

---

**මාතෘකාව : 3 අර්පණය සහ ප්‍රතිග්‍රහණය**
**පිටු අංක : 37**

*මාතෘකාව 3- අර්පණය සහ ප්‍රතිග්‍රහණය යන විෂය කරුණු පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් පහත දැක්වේ.*

'මෙම කොටස තුළ අප වලංගු ගිවිසුමක් තුළ පවතින ප්‍රධාන මූලිකාංග දෙක වන අර්පණය හා ප්‍රතිග්‍රහණය පිළිබඳ විස්තරාත්මකව සලකා බලන්නෙමු. මේවා ඇති වන්නේ කෙසේද හා සන්නිවේදනය වන්නේ කෙසේද, ඒවා අවසාන වන්නේ කෙසේ ද හා ඒවාට අදාළ විවිධ රීති මොනවාද යන්න අප ඒ අනුව විමසා බලමු.

අර්පණය යනු යම් නිශ්චිත ගිවිසුම් නියම මත ගිවිසුමකට එළැඹීම සඳහා වූ අභිලාෂය ප්‍රකාශ කරනු ලබන ප්‍රකාශනයකි. එය ඉදිරිපත් කරන්නේ අර්පණලාභියා එය පිළිගත් විට එම ප්‍රකාශනය දෙපාර්ශවය මත බන්ධනාත්මක වනු ඇත යන චේතනාව සහිතවය.

වෙනත් වචනවලින් ප්‍රකාශකරන්නේ නම්, අර්පණකරු බැඳීමට ලක්වීමට සූදානම් ගිවිසුම් නියම කවරේදැයි ප්‍රකාශ කරන ප්‍රකාශනයක් ලෙස අර්පණය හැඳින්විය හැක.

All Rights Reserved 

ප්‍රතිග්‍රහණය යනු අර්පණකරු විසින් ඉදිරිපත් කළ නියමයන්වලට අර්පණලාභියා දක්වන එකඟතාවයයි. වෙනත් වචනවලින් ප්‍රකාශකරන්නේ නම්, අර්පණයේ ඇතුලත් නියම හා කොන්දේසිවලින් බැඳීමට ලක්වීමට අර්පණලාභියා තුළ පවතින සූදානම ප්‍රකාශ කරන ප්‍රතිඥාවක් හෝ ක්‍රියාවක් ලෙස ප්‍රතිග්‍රහණය යන්න දැක්විය හැක.

---

**මාතෘකාව : 6.1.4 උදාහරණය : විනිශ්චය පිළිබඳ වැරදීම**
**පිටු අංක : 55**

*6.1.4 උදාහරණය පහත ආකාරයට සවිස්තරාත්මකව දක්වා ඇත.*

X, යම් භාණ්ඩ ප්‍රමාණයක් මිල දී ගන්නේ එය රු. මිලියන 1 ක වටිනාකමින් යුක්ත බවට වූ විශ්වාසය මතය. එහෙත් එහි වටිනාකම සැබැවින්ම රු. 100,000 ක් නොඉක්මවන බව ඔහු පසුව අනාවරණය කරගනී.

මෙහිදී භාණ්ඩවල සැබෑ වටිනාකම විනිශ්චය කිරීමෙහිලා වරදක් X විසින් සිදුකොට ඇත.

මෙබඳු වරදක් විසින් ගිවිසුමක් බලරහිත නොකරන නිසා X විසින් ඇතුලත් වූ ගිවිසුම වලංගු වේ.

---

**මාතෘකාව : 6.3 අයුතු බලපෑම**
**අනු කරුණ : පූර්වානුමාන අයුතු බලපෑම**
**පිටු අංක : 58**

*'පූර්වානුමාන අයුතු බලපෑම' යටතේ දක්වා ඇති අනු කරුණු පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

මෙම සබඳතාවලින් සමහරක් පහත පරිදි වේ.

- දෙමාපියන් හා දරුවා
- භාරකරු හා ආරක්ෂිතයා ('ආරක්ෂිතයා' යනු දෙමාපියන් හෝ අධිකරණය විසින් භාරකරුවෙක්ගේ ආරක්ෂාව හා පාලනය යටතට පත්කරනු ලැබූ ළමයෙකු හෝ යෞවනයෙකි)
- වෛද්‍යවරයා සහ රෝගියා
- නීතිඥවරයා සහ සේවාදායකයා
- ආධ්‍යාත්මික උපදේශක සහ අනුගාමික

All Rights Reserved

**මාතෘකාව : 12.1 ගිවිසුම්වල කාලාවරෝධ කාලසීමාව**

**පිටු අංක : 71**

*මාතෘකාව : 12.1 යටතේ දක්වා ඇති පළමු ඡේදය පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

**12.1 ගිවිසුම්වල කාලවරෝධ කාල සීමා**

1871 අංක 22 දරන කාලවරෝධ ආඥා පනත සහ එහි සංශෝධන නඩු පැවරීම්වලට අදාල කාලවරෝධී කාල සීමා කවරේද යන්න දක්වයි. ආඥාපනතේ 6 වන වගන්තිය ඒ අනුව ගිවිසුම් කඩකිරීමකදී අගතියට පත් පාර්ශවය විසින් නඩු පවරනු ලැබිය යුතු කාල සීමාව කවරේදැයි ප්‍රකාශ කරයි.

All Rights Reserved 

# පරිච්ඡේදය 3 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන භාණ්ඩ විකිණීම (මූලික දැනුම)

**මාතෘකාව - 1.2 භාණ්ඩ විකිණීම සඳහා වූ ගිවිසුමක් යනු කුමක්ද?**
**පිටු අංක - 80**

*1.2 මාතෘකාව යටතේ දක්වා ඇති විෂය කරුණු පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

**1.2 භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යනු කුමක්ද?**

**ආඥාපනත අදාළ වන්නේ කවර භාණ්ඩවලටද?**

භාණ්ඩ විකිණීමේ ආඥාපනත අනුව 'භාණ්ඩ' යන්නට 'මුදල් හැර සියලු චංචල දේ' ඇතුලත් වේ.

'භාණ්ඩ' යන පදයට 'විකිණීමට පෙර හෝ විකිණීමේ ගිවිසුම යටතේ හෝ වෙන් කරගැනීමට එකඟ වූ වගාකළ භෝග හා යම් භූමියකට ආබද්ධ වූ හෝ එම භූමියේ කොටසක් සංයුක්ත කරන දෑ' ද ඇතුලත් වේ.

ඒ අනුව මුදල් හැර චංචල ස්වභාවයක් උසුලන හෝ භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යටතේ චංචල ස්වභාවයකට පත්වන කවර හෝ භාණ්ඩයකට භාණ්ඩ විකිණීමේ ආඥාපනත අදාළ වන බව කිවහැක.

ආඥාපනතේ 2.1 වගන්තිය අනුව 'මිල යනුවෙන් හඳුන්වනු ලැබෙන මුදල්මය ප්‍රතිෂ්ටාවක් මත විකිණුම්කරු භාණ්ඩවල අයිතිය ගැණුම්කරුට භුවමාරු කරන හෝ භුවමාරු කිරීමට එකඟ වෙන ගිවිසුමක්, භාණ්ඩ විකිණීම සඳහා වූ ගිවිසුමක් වේ'.

භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට **විකිණීමක්** මෙන්ම **විකිණීමට එකඟවීමක් ද** ඇතුලත් වේ.

All Rights Reserved

**මාතෘකාව : ප්‍රගති පරීක්ෂණය**
**පිටු අංක : 98**

*ප්‍රශ්න අංක 4 (ආ) පහත පරිදි වෙනස්විය යුතුය.*

4. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(අ) ''භාණ්ඩ තොගය නියැදියට හා විස්තරයට අනුකූලවිය යුතුය'' මෙය භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ව්‍යංග කොන්දේසියකි.

(ආ) පේටන්ට් හෝ වෙළඳ ලකුණක් යටතේ වූ භාණ්ඩ සම්බන්ධයෙන් එම භාණ්ඩ ඒවායේ අරමුණට යෝග්‍ය වීම සම්බන්ධව ව්‍යංග කොන්දේසියක් නොමැත.

(ඇ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් යටතේ, අයිතිකරු නොවන පුද්ගලයකුගෙන් භාණ්ඩ මිලදී ගත්තද, නිර්දෝෂී ගැනුම්කරුවකුට හොඳ හිමිකමක් ලැබේ.

(ඈ) නිශ්චය නොකළ භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අදාළ සාමාන්‍ය රීතිය වන්නේ භාණ්ඩය නිශ්චය කරන තෙක් භාණ්ඩයේ අයිතිය ගැනුම්කරුට නොපැවරෙන බවයි.

නිවැරදි පිළිතුර = 'ඇ'

All Rights Reserved 

# පරිච්ඡේදය 5 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන නියෝජ්‍යත්ව නීතිය

**මාතෘකාව : 2.3.1 නඩු තීන්දු - අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය**
**පිටු අංක : 124**

*'අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වය' යටතේ දක්වා ඇති පෙර නඩු තීන්දුවේ, නම් පහත පරිදි සංශෝධනය වියයුතුය.*

ජී.එන්.රයි එදිරිව ස්වොෆීල්ඩ් *'G.N. Ry. v Swaffield [1874] L.R. 9 Ex. 132'* යන්න ග්‍රේට් නෝදර්න් රේල්වේ එදිරිව ස්වොෆීල්ඩ් *Great Northern Railway. v Swaffield* [1874] L.R. 9 Ex. 132' ලෙස කියැවිය යුතුය.

---

**මාතෘකාව : 2.3.2 අනුමත කිරීම මගින් නියෝජ්‍යත්වය**
**පිටු අංක : 125**

2.3.2 *මාතෘකාව යටතේ ඇති කරුණු පහත පරිදි සංශෝධනය වියයුතුය.*

- නියෝජිතයා ප්‍රකාශිතවම තමන් නියෝජිතයෙක් ලෙස ගිවිසුමට ඇතුළු වී තිබිය යුතුය.
- ගිවිසුමක් අපරානුමත කළ හැක්කේ ප්‍රධානියා ලෙස නම් කරනු ලැබූ හෝ ගිවිසුම ඇති වෙන අවස්ථාවේ ප්‍රධානියා ලෙස නිර්ණය වී තිබූ අයට පමණි.
- නියෝජිතයාට ගිවිසුම ඇති කරගන්නා අවස්ථාවේ සැබෑ පැවැත්මක් සහිත ප්‍රධානියෙක් සිටිය යුතුය.
- ගිවිසුම ඇති කරගන්නා අවස්ථාවේ හා එය අපරානුමත කරන අවස්ථාවේ ප්‍රධානියාට ගිවිසුම් ශක්‍යතාවය තිබිය යුතුය.
- අපරානුමත කිරීම, නියම කරනු ලැබූ කාල රාමුව තුළදීම කළ යුතුය. කාල රාමුවක් දී නැතිනම් සාධාරණ කාලයක් තුළ කළ යුතුය.
- සම්පූර්ණ ගිවිසුමම අපරානුමත කළයුතු අතර ගිවිසුමේ කොටසක් පමණක් අපරානුමත කළ නොහැක.

All Rights Reserved 

**මාතෘකාව : 5.1 ප්‍රධානියා වෙත ඇති නියෝජිතගේ වගකීම් (නියෝජිතයාට එරෙහිව ප්‍රධානියාගේ අයිතිවාසිකම්)**

**පිටු අංක : 131**

*'නියෝජිත දැනුවත් වූ වැදගත් කරුණු හෙළිකිරීම' යටතේ ඇති නඩු තීන්දුව පහත ආකාරයට වැඩිදුරටත් විස්තරකර ඇත.*

**නඩු තීන්දු - නියෝජිත දැනුවත්වූ වැදගත් කරුණු හෙළිකිරීම**

පාකින්සන් (P) විසින් හීත් (H) ව පාකින්සන්ගේ පවුම් 2500 ක් වටිනා බද්දට ගත් ඉඩම සඳහා ගැණුම්කරුවෙක් සොයා දීමේ කටයුත්ත පවරා ඔහුව නියෝජිතයෙක් ලෙස පත්කරන ලදී. ඇඳුම් මැසීමේ නියුක්ත විශාල සමාගම් මෙම මිල ගෙවීමට සූදානම් බව 'H' දැන සිටියේය. එහෙත් අදාළ ඉඩම ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් සඳහා යොදාගන්නවාට ඉඩම් හිමියා අකමැති බවට අදහසක් P තුළ විය.

'P' ගේ බදු අයිතිය මිලදී ගැනීමට ඇඳුම් මසන්නන් කිහිප දෙනෙක් ඉදිරිපත්වීම නිසා, 'H', 'P' ට නොදන්වා අදාළ ඉඩමේ ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යා හැකි බවට ඉඩම් හිමියාගෙන් සහතිකයක් ලබා ගත්තේය.

ඉඩම් හිමියා එලෙස සහතිකයක් ලබා දුන් බවට වූ කරුණ 'H', 'P' ට හෙළිදරවු නොකළේය. තවද බද්ද මිලදී ගැනීමට ඉදිරිපත් වූ අය ඇඳුම් මැසීමේ ව්‍යාපාරයේ නියුක්ත අයෙකි යන කරුණ ද 'H', 'P' ගෙන් වසන් කළ අතර ඒ අනුව පවුම් 2250 ක් වූ අඩු අගයකට ස්වකීය බදු හිමිකම විකිණීම කෙරෙහි 'P' පෙළඹුණ.

තීන්දුව - ගිවිසුම ඇති කරගැනීමේ දී ප්‍රධානියා (P) කෙරෙහි බලපෑහැකි කවර හෝ කරුණක් පිලිබඳ නියෝජිතයා (H) දැනගත්තේ නම් එම කරුණ ප්‍රධානියාට ඔහු හෙළිදරවු කළ යුතුය. මෙම අවස්ථාවේදී එකී යුතුකම ඉටු කිරීමට H අසමත් වී තිබේ.

***හීත් එදිරිව පාකින්සන් Heath v Parkinson* [1926] 42 P.L.R. 693**

---

**මාතෘකාව : 5.1 ප්‍රධානියා වෙත ඇති නියෝජිතගේ වගකීම් (නියෝජිතයාට එරෙහිව ප්‍රධානියාගේ අයිතිවාසිකම්)**

**පිටු අංක : 132**

*'ලාභය රහස්‍ය ලාභයක් නොවන විට' මේ යටතේ එන පෙර නඩු තීන්දුවේ නම් පහත පරිදි සංශෝධනය විය යුතුය.*

හිපිස්ලී එදිරිව නී සොහොයුරෝ *Hippisley v Knee Bros*[1905] 1 K.B. 1 ලෙස වෙනස්විය යුතුය.

All Rights Reserved 

**මාතෘකාව : 5.1 ප්‍රධානියා කෙරෙහි වූ නියෝජිතයාගේ යුතුකම් (නියෝජිතයාට එරෙහිව ප්‍රධානියා සතු අයිතිවාසිකම්)**
**පිටු අංක : 133**

*'නියෝජිතයා එවැනි යම් ලාභයක් ලබන්නේ ප්‍රධානියාගේ කැමැත්ත නොමැතිව නම්, ප්‍රධානියාට පහත දැක්වෙන දෑ කිරීමට හිමිකම ඇත', යටතේ කරුණු පහත නඩු තීන්දුව ද ඇතුලත්කර සවිස්තරාත්මක දක්වා ඇත.*

**නියෝජිතයා එවැනි යම් ලාභයක් ලබන්නේ ප්‍රධානියාගේ කැමැත්ත නොමැතිව නම්, ප්‍රධානියාට පහත දැක්වෙන දෑ කිරීමට හිමිකම ඇත.**

- නියෝජිතයාට ඔහුගේ කොමිස් මුදල හෝ වේතනය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම.
- නියෝජිත ගිවිසුම අවලංගු කිරීම.
- නියෝජිතගෙන් රහසය ලාභය අයකර ගැනීම. මෙය හිපිස්ලි එදිරිව නී සොහොයුරෝ *Hippisley v Knee Bros*[1905] 1 K.B. 1 නඩුවෙහි දී ඇති තීරණයකි.
- දැනුම් දීමකින් තොරව නියෝජිතයා පහ කොට දැමීම.

**නඩු තීන්දු - දැනුම් දීමකින් තොරව නියෝජිතයා පහ කොට දැමීම**

| |
|---|
| ඇන්සෙල් (A) , බොස්ටන් "ඩීප් සී ෆිෂිං ඇන් අයිස්" (B) නම් වූ සමාගමේ කලමනාකරණ අධ්‍යක්ෂක විය. 'A' බෝට්ටු සාදන සමාගමක අධ්‍යක්ෂකවරයෙක් ලෙසද ක්‍රියාකළ අතර ඒබව 'B' දැන සිටියේ නැත.<br><br>'B' හි කළමනාකරණ අධ්‍යක්ෂක ලෙස 'A', 'B' ගේ නමට අදාළ බෝට්ටු සාදන සමාගමෙන් ඇණවුම් කිහිපයක් සිදුකළේය. මේ සඳහා බෝට්ටු සාදන සමාගමෙන් ප්‍රසාද දීමනා හා කොමිස් මුදල් 'A'' වෙත ලැබුණි.<br><br>මේ බව අනාවරණය වීමෙන් පසු 'B', 'A' ව සේවයෙන් පහ කලේය.<br><br>තීන්දුව - රහසය ලාභ ලැබීම නිසා 'A' ව පහ කිරීමේ අයිතිය 'B' ට තිබේ. එලෙස ලැබූ ලාභ සම්බන්ධයෙන් 'B' ට වගවීමේ වගකීමක් 'A' ට ඇත. |
| ***ඩීප් සී ෆිෂිං ඇන්ඩ් අයිස් සමාගම එදිරිව ඇන්සෙල් Deep Sea Fishing and Ice Co. v Ansell* [1883] 39 Ch.D. 339** |

All Rights Reserved

**මාතෘකාව : 7.1.1 නියෝජිතයා ගිවිසුමකදී පෞද්ගලිකව වගකිව යුතු අවස්ථා**
**පිටු අංක : 137**

*'නොපවත්නා ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිස ගැනීම' යටතේ ඇති නඩු තීන්දුව පහත ආකාරයට වැඩිදුරටත් විස්තර කර ඇත.*

**නඩු තීන්දු - නොපවත්නා ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිස ගැනීම**

හෝටල් සමාගමක ප්‍රවර්ධකයින් සංස්ථාපනය කිරීමට නියමිත සමාගම වෙනුවෙන් ණයට වයින් මිලදී ගැනීම සඳහා වූ ගිවිසුමකට එළැඹුණි. සමාගම සංස්ථාපනය කළා පසු එය මෙම ගිවිසුම අපරානුමත කළේය. හෝටලයේ අමුත්තන් මෙම වයින් පරිභෝජනය කළ අතර කෙසේ වුවද ණයකරුවන්ට ණය ගෙවා අවසාන වීමට පෙර මෙම සමාගම ඈවර කරන ලදී. ණයකරුවෝ, නියෝජිතයින් ලෙස සලකා ප්‍රවර්ධකයින්ට එරෙහිව නඩු පැවරූහ.

සමාගම මෙම ගිවිසුම අපරානුමත කරනු ලැබූ නිසා ගිවිසුම යටතේ වූ වගකීම සමාගම වෙත විතැන් වී තිබෙන බවට ප්‍රවර්ධකයෝ තර්ක කළහ.

තීන්දුව - ප්‍රවර්ධකයින් පුද්ගලිකව මෙම ගිවිසුම සඳහා වගකීමට බැඳේ. මක්නිසාදයත් නියෝජිතයින් ගිවිසුමට එළැඹුණු අවස්ථාව වනවිට සමාගම (ප්‍රධානියා) සතුව පැවැත්මක් නොතිබූ නිසාය.

**කෙල්නර් එදිරිව බැක්ස්ටර් Kelner v Baxter (1866) LR 2 CP 174; [1861-73] All ER 2009.**

All Rights Reserved 

# පරිච්ඡේදය 6 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන
# හවුල් ව්‍යාපාර නීතිය

**මාතෘකාව : 1.1 අදාළ නීතිය**
**පිටු අංක : 144**

*1.1 යටතේ ඇති ඡේද පහත ආකාරයට සංශෝධනය විය යුතුය.*

**1.1 අදාළ නීතිය**

ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සඳහා අදාළ වන්නා වූ නීතිය පිළිබඳව මෙහිදී අප සාකච්ඡා කරමු.

හවුල් ව්‍යාපාර යනු ඉංග්‍රීසි නීතිය ආශ්‍රයෙන් ව්‍යුත්පන්න වූ සංකල්පයකි. එමනිසා ශ්‍රී ලංකාව තුළ හවුල් ව්‍යාපාර පාලනය වන නීතිය ඉංග්‍රීසි නීතිය මත පදනම් වී තිබේ. ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාර සඳහා බලපාන නීතිය 1886 අංක 21 දරන හවුල් ව්‍යාපාර ආඥා පනතේ හා ඉංග්‍රීසි අධිකරණවල අධිකරණ තීන්දු තුළ සංයුක්ත වී තිබේ.

---

**මාතෘකාව : 1.4 හවුල්කරුවන්ගේ සංඛ්‍යාව පිළිබඳ සීමාවන්**
**පිටු අංක : 145**

*1.4 යටතේ ඇති ඡේද පහත ආකාරයට සවිස්තරාත්මකව දක්වා ඇත.*

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ පොදු රීතිය වනුයේ හවුල් ව්‍යාපාරයක අසීමිත හවුල්කරුවන් සංඛ්‍යාවක් සිටිය නොහැක යන්නයි. එහෙත් මෙම රීතියට අදාළ ව්‍යතිරේඛයන් ද පවතී.

2007 අංක 7 දරන සමාගම් පනතේ 519(1) වගන්තිය ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම සාමාජික සංඛ්‍යාව 20 ක් බව දක්වා තිබේ.

කෙසේ වුවද සමාගම් පනතේ 519(3) වගන්තිය ශ්‍රී ලංකාවේ හවුල් ව්‍යාපාරයක සාමාජිකයින් 20 ට වැඩි සංඛ්‍යාවක් සිටිය හැකි අවස්ථා දක්වයි. එකී අවස්ථා පහත පරිදිය.

- හවුල් ව්‍යාපාරය නීතිඥ සේවා සපයන ආයතනයක් වන්නේ නම් හා සියලුම හවුල්කරුවන් නීතිඥයින් වේ නම්,
- හවුල් ව්‍යාපාරය ගණකාධිකාරී ආයතනයක් වන්නේ නම් හා සියලුම හවුල්කරුවන් ගණකාධිකාරීවරු වේ නම්,
- බලපත්‍රලාභී කොටස් හුවමාරුවක සාමාජිකයින් ලෙස හවුල් ව්‍යාපාරය ක්‍රියා කරන්නේ නම් හා සියලුම හවුල්කරුවන් එම බලපත්‍රලාභී කොටස් හුවමාරුවේ සාමාජිකයින් වේ නම්,
- හවුල් ව්‍යාපාරය නිර්දේශිත අරමුණක් සඳහා ඇතිකරනු ලැබූ විට හා සියලුම හවුල්කරුවන් නිර්දේශ කරනු ලැබ ඇති විට.

All Rights Reserved 

**මාතෘකාව : 1.5 වංචා වැලැක්වීමේ ආඥා පනත හා හවුල් ව්‍යාපාරයක් පිහිටුවා ගැනීම**
**පිටු අංක : 145**

*1.5 යටතේ ඇති ඡේද පහත ආකාරයට වැඩිදුර විස්තරකර ඇත.*

හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී හවුල්කරුවන් අතර ඇති එකඟතාවය දක්වන ලියවිල්ල වෙන්නේ හවුල් ව්‍යාපාර ගිවිසුමයි. කෙසේ වුවද හවුල් ව්‍යාපාර ගිවිසුමක් ලිඛිතව පැවතීම අනිවාර්ය වන්නේ එක් නිශ්චිත අවස්ථාවක් යටතේදී පමණි.

1840 අංක 7 දරන වංචා වැලැක්වීමේ ආඥා පනතේ 18 වන වගන්තිය අනුව, ප්‍රාග්ධනය රු. 1000 ඉක්මවන හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේ දී, ඒ සඳහා වූ ගිවිසුම හෝ ඔප්පුව ලිඛිත වියයුතු අතර සියලුම හවුල්කරුවන් විසින් අත්සන් කර තිබිය යුතුය.

18 වන වගන්තිය මගින් පනවා තිබෙන මෙම කොන්දේසිය ඉටු නොවන්නේ නම් එම ගිවිසුම නීතිමය වශයෙන් වලංගු වන්නේ නැත.

---

**මාතෘකාව : 1.6 හවුල් ව්‍යාපාරයක් ලියාපදංචි කරන්නේ කෙසේද?**
**පිටු අංක : 146**

*1.6 යටතේ ඇති ඡේදයේ* ව්‍යාපාර නාම ආඥා පනත *පහත ආකාරයට සංශෝධනය විය යුතුය.*

## 1.6 හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කරන්නේ කෙසේද?

1918 අංක 16 දරන ව්‍යාපාර නාම පනත හවුල් ව්‍යාපාරයක නම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අදාළ වේ.

1918 අංක 16 දරන ව්‍යාපාර නාම ආඥා පනත හා එහි සංශෝධන මගින් දක්වන ප්‍රතිපාදන අනුව ව්‍යාපාර නාමයක් යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම සිදුකළ හැක.

ආඥා පනතේ 2 වන වගන්තිය අනුව 'ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන සෑම ව්‍යාපාරයක්ම හා ව්‍යාපාරයේ හවුල්කරුවන් කේවල පුද්ගලයින් වන විට එම සියලු හවුල්කරුවන්ගේ සත්‍යය සම්පූර්ණ නම් හෝ ව්‍යාපාර හවුල්කරුවන් සමාගම් වන විට එම සමාගම්වල නම් හෝ නොවන වෙනත් නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යන ආයතන' එම හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන නම ලියාපදිංචි කළ යුතු වේ.

All Rights Reserved

**මාතෘකාව : 3.1 නව හවුල්කරු**
**පිටු අංක : 150**

*3.1 උප මාතෘකාව යටතේ දැනට පවතින අන්තර්ගතය පහතින් සවිස්තරාත්මක දක්වා ඇත.*

## 3.1 නව හවුල්කරු

දැනට පවතින ව්‍යාපාරයකට හවුල්කරුවෙක් ලෙස බඳවා ගනු ලැබෙන පුද්ගලයෙක් නව හවුල්කරුවෙක් නම් වේ.

ඔහු හවුල්කරුවෙකු වීමට පෙර, ව්‍යාපාරය විසින් කළ කවර හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් නව හවුල්කරුවෙක් ව්‍යාපාරයේ ණය හිමියන් වෙත **වගකිව යුතු නොවේ.**

කෙසේ වුවද නව හවුල්කරු කැමැති නම් තමා සම්බන්ධ වීමට පෙර ව්‍යාපාරය බැඳුණු වගකීම් භාර ගැනීමේ හැකියාව ඔහුට ඇත. ව්‍යාපාරයේ පැරණි වගකීම් මෙලෙස ස්වේච්ඡාවෙන් භාර ගැනීම **නවායනය (novation)** නම්වේ.

නවායනය **(novation)** යනු පැරණි ගිවිසුම අලුත් ගිවිසුමක් මගින් විස්ථාපනය කිරීමයි. නවායනයක් සාමාන්‍යයෙන් සිදුවන්නේ නව පුද්ගලයෙක් ගිවිසුමට සම්බන්ධ මුල් පාර්ශවය විසින් ඇති කළ ගෙවීමක් සම්බන්ධ බැඳීමක් භාර ගන්නා අවස්ථාවේය.

**උදාහරණය - නවායනය**

Y ගේ සියලු ලිපි ද්‍රව්‍ය අවශ්‍යතා මාස දෙකක කාලයකට ණයට සැපයීම සඳහා වූ ගිවිසුමකට X හා Y අතර ගිවිසුමක් ඇති වේ. X දැනටමත් ලිපි ද්‍රව්‍ය තොගයක් සපයා ඇති අතර Y ඒවාට ගෙවිය යුතුව තිබුණි. අදාළ ගෙවීම් සිදු කිරීම සඳහා වූ ප්‍රමාණවත් තරම් අරමුදල් Y වෙත නොතිබූ නිසා හෙතෙම හවුල්කරුවෙක් ලෙස ව්‍යාපාරයට සම්බන්ධ වෙන ලෙස Z ට ආරාධනා කළේය. Z ව්‍යාපාරයට සම්බන්ධ වූ අතර සපයා තිබෙන ලිපි ද්‍රව්‍යවලට අදාළ ගෙවීම් X වෙත කිරීමට එකඟ වේ.

මේ අරමුණ සඳහා X , Y හා Z නව ගිවිසුමකට එළැඹෙන අතර එමගින් ලිපි ද්‍රව්‍ය වල අනාගත සැපයුම හා දැන් සපයා තිබෙන ලිපිද්‍රව්‍ය සඳහා X වෙත අවශ්‍ය ගෙවීම් Z විසින් කරනු ලැබීමට අදාළ පාර්ශවයන්ගේ අනුමැතිය සම්බන්ධ නව ගිවිසුම් ප්‍රතිපාදන ද ප්‍රකාශ කරන ලදී.

මෙම තත්වය තුළ දෙවැනි ගිවිසුම විසින් පළමු ගිවිසුම අවලංගු කරනු ලැබේ. එමනිසා මෙය නවායනයකි.

All Rights Reserved

**මාතෘකාව : 3.2.1 හවුල්කරුගේ විශ්‍රාමයාම / ඉල්ලා අස්වීම**
**පිටු අංක : 151**

*'කලින් ව්‍යාපාර සමග ගනුදෙනු නොකළ හා තමා හවුල්කරුවකු බව නොදැනසිටි පුද්ගලයකුට විශ්‍රාම ගන්නා හවුල්කරුගේ ඇති වගකීම' යටතේ ඇති නඩු තීන්දුව පහත ආකාරයට වැඩිදුරටත් විස්තර කරඇත.*

**නඩු තීන්දු - 'කලින් ව්‍යාපාර සමග ගනුදෙනු නොකළ හා තමා හවුල්කරුවකු බව නොදැනසිටි පුද්ගලයකුට විශ්‍රාම ගන්නා හවුල්කරුගේ ඇති වගකීම'**

ඉංග්‍රම් (I) හා ක්‍රිස්මස් (C), 'මෙරීස්' නම් වූ ව්‍යාපාරයේ හවුල්කරුවෝ වූහ. 'I' 1947 දී විශ්‍රාම ගත් අතර හවුල් ව්‍යාපාරය විසුරුවා හැරිණ. ව්‍යාපාරය සමග ගනුදෙනු කළ අයට 'I' ගේ විශ්‍රාම යාම ගැන දැනුම් දීමේ වගකීම 'C' භාර ගත්තේය. එහෙත් කිසිදු දැනුම් දීමක් සිදු නොවූ අතර කිසිදු දැන්වීමක් ද ඒ සම්බන්ධයෙන් පළ වූයේ නැත. 1948 දී 'C' ටවර් කැබිනට් සමාගමෙන් (T) භාණ්ඩ තොගයක් ඇනවුම් කළ අතර ඒ සඳහා භාවිතා කළ ලිපි ශීර්ෂයේ ව්‍යාපාරයේ හවුල්කරුවෙක් ලෙස 'I' ගේ නම ද සඳහන් වූයේය. (T) 'මෙරීස්' සමග මීට පෙර ගනුදෙනු කොට නොතිබූ අතර ව්‍යාපාරය විසුරුවා හැරීමට පෙර 'I' හවුල්කරුවෙක් වූ බව හා දැන් ඔහු විශ්‍රාම ගෙන තිබෙන බව දැන සිටියේ නැත. භාණ්ඩවලට අදාළ වටිනාකම 'මෙරීස්' විසින් 'T' ට ගෙවනු ලැබූයේ නැත. එහි ප්‍රතිඵලයක් ලෙස 'T' 'මෙරීස්' ට එරෙහිව නඩු පැවරීය.

තීන්දුව - මෙය ව්‍යාපාරය සමග 'T' කළ පළමු ගනුදෙනුව වූ නිසා 'I' ව්‍යාපාරයේ හවුල්කරුවෙක්ව සිටි බව 'T' දැන නොසිටි බව පැහැදිලිය. එමනිසා 'T' ගේ විශ්‍රාම යාම ගැන ඔහුට දැනුම් දීමක් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත. එමනිසා ව්‍යාපාරය විසින් 'T' ගෙන් ඇනවුම් කළ භාණ්ඩවල මිල සම්බන්ධයෙන් 'T' වෙත 'I' ගේ වගකීමක් නොමැත.

***ටවර් කැබිනට් සමාගම එදිරිව ඉංග්‍රම් Tower Cabinet Co. Ltd. v Ingram* [1949] 2 K.B. 397**

All Rights Reserved 

# පරිච්ඡේදය 8 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන
# කුලී සින්නක්කර, කල්බදු හා ණය

**මාතෘකාව - 1.1 අදාළ වන නීතිය**
**පිටු අංක - 184**

*1.1 අනු මාතෘකාව යටතේ එන අන්තර්ගතය පහත පරිදි විස්තර විය යුතුය.*

**1.1 අදාළ වන නීතිය**

ශ්‍රී ලංකාව තුළ, කුලී සින්නක්කර පාලනය වන්නේ 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත හා එහි සංශෝධන හරහාය. කුලී සින්නක්කර ගිවිසුම්වල පාර්ශවකරුවන්ගේ වගකීම් නිර්වචනය කිරීම හා ඒවා නියාමනය කිරීම මෙම පනත විසින් මූලික වශයෙන් සිදුකරන කාර්යයයි.

---

**මාතෘකාව - 1.9 කුලී සින්නක්කර හිමියාගේ අයිතිවාසිකම්**
**පිටු අංක - 187**

*1.9 අනු මාතෘකාව යටතේ එන අන්තර්ගතය පහත පරිදි විස්තර විය යුතුය.*

**1.9 කුලී සින්නක්කර හිමියාගේ අයිතිවාසිකම්**

කුලී සින්නක්කර ගිවිසුමක හිමිකරු සතු මූලික අයිතිවාසිකම් පහත පරිදිය.

- කුලී සින්නක්කර ගැණුම්කරු විසින් වාරික ගෙවීම් නිසි ලෙස නොකරනු ලබන විට හෝ ගිවිසුම උල්ලංඝණය කරනු ලැබ ඇති විට ගැණුම්කරුට නිසිලෙස ලිඛිත දැනුම් දීමක් සිදුකොට ගිවිසුම අවසන් කිරීම.

මෙබදු අවස්ථාවල පහත කී දේවලට හිමිකරු අයිතිවාසිකම් ලබයි

- ගෙවනු ලැබූ වාරික හා මූලික තැන්පතුව රඳවා ගැනීමට හා හිඟ තිබේ නම් අය කර ගැනීමට තිබෙන අයිතිය.

- කුලී සින්නක්කර මිලෙහි සියයට හැත්තෑ පහකට (75%) අඩු ප්‍රමාණයක් ගෙවනු ලැබ තිබෙන විට අධිකරණයේ නඩු පැවරීමකින් තොරව භාණ්ඩවල සන්තකය නැවත ලබාගැනීමට තිබෙන අයිතිය.

  එහෙත් කුලී සින්නක්කර මිලෙහි සියයට හැත්තෑ පහකට (75%) හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවනු ලැබ ඇත්නම් හිමිකරුට භාණ්ඩවල සන්තකය නැවත ලබාගත හැක්කේ අධිකරණ ක්‍රියාමාර්ගයක් හරහා පමණි.

- යම් අලාභයකට මුහුණ දීමට සිදු වී නම් ඒ සඳහා වන්දි ලබාගැනීම.

- කුලී සින්නක්කර ගිවිසුම යටතේ වූ අයිතිවාසිකම් හා බැඳීම් වෙනත් පාර්ශවයකට අනුයුක්ත කිරීමට ඇති අයිතිය.

All Rights Reserved 

**උප මාතෘකාව - 2.1 අදාළ වන නීතිය**
**පිටු අංක - 188**

*ඉහත උප මාතෘකාව යටතේ එන අන්තර්ගතය පහත පරිදි වෙනස් විය යුතුය.*

**2.1 අදාල වන නීතිය**

ශ්‍රී ලංකාව තුළ **මූල්‍ය කල්බදු** පාලනය කරනු ල බන නීතිය වන්නේ **2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත හා ඊට එකතු කල සංශෝධනයන්ය.**

---

**මාතෘකාව - 2.2 කල්බදු සංකල්පය**
**පිටු අංක - 188**

*2.2 මාතෘකාවට පසු 2.2 (අ) ලෙස පහත පරිදි නව අනු මාතෘකාවක් එකතු විය යුතුය.*

**2.2 (අ) ශ්‍රී ලංකාව තුළ මූල්‍ය කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යා හැක්කේ කාටද?**

පනතේ 2 වගන්තිය අනුව 'පනත යටතේ ලියාපදිංචි වූ අයෙක් හැරුණු කොට අන් කවර හෝ අයෙක්ට' මූල්‍ය කල්බදු ව්‍යාපාරයක් පවත්වාගෙන යා නොහැක.

**2.2 (අ) 1. පනත යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන පුද්ගලයින්**

පනතේ 3 වගන්තිය පනත යටතේ මූල්‍ය කල්බදු ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වීම සඳහා සම්පූර්ණ කළ යුතු සුදුසුකම් දක්වයි.

- 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක්
- 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්
- 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ වූ මූල්‍ය සමාගමක්
- 1982 අංක 17 දරන පැරණි සමාගම් පනත යටතේ සංස්ථාපනය කරනු ලැබූ නියමිත කොටස් නිකුතුව හා ගෙවනු ලැබූ ප්‍රාග්ධනය සහිත පොදු සමාගමක්.
  (එහෙත් පැරණි සමාගම් පනත 2007 අංක 7 දරන සමාගම් පනත මගින් විස්ථාපනය කරනු ලැබූ නිසා 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කල නිර්දේශිත ප්‍රාග්ධනය සහිත සියලු පොදු සමාගම් මූල්‍ය කල්බදු පනත යටතේ මූල්‍ය කල්බදු ව්‍යාපාර ලෙස ලියාපදිංචිය ලැබීමේ හැකියාව ලබන බව ප්‍රකාශ කල හැක)

All Rights Reserved

**මාතෘකාව : 3.4.1 මුල්‍ය ආයතන මගින් සිදු කරනු ලබන ඒක පාර්ශ්වීය ක්‍රියාත්මක කිරීම්**
**පිටු අංක : 195**

*3.4.1 උප මාතෘකාව යටතේ දැනට පවතින පළමු ඡේදයට පහත කොටස් ආදේශ විය යුතුය.*

3.4.1 මූල්‍ය ආයතන විසින් සිදුකරන **'පරාටේ ඇස්කිසිය'**

**'**පරාටේ**'** යනු රෝම ලන්දේසි නීතිය තුළින් පැමිණි යෙදුමකි. එහි අදහස 'වහාම' යන්නය. 'පරාටේ ඇස්කිසිය' යනු අධිකරණයේ ආධාරය අපේක්ෂා නොකොට, උකස් කළ දේපළ විකුණා ණය ආපසු අය කරගැනීම සඳහා උකස් හිමියාට බලය ලබාදෙන ණය ආපසු අය කරගැනීමේ ක්‍රියාවලියකි.

---

**මාතෘකාව : පරිච්ඡේද සාරාංශය**
**පිටු අංක : 200**

*පරිච්ඡේද සාරාංශය යටතේ ඇති අවසාන කරුණ පහත පරිදි සංශෝධනය විය යුතුය.*

↳ ''**පරාටේ**'' යනු රෝම ලන්දේසි නීතිය තුළින් පැමිණි යෙදුමකි. එහි අදහස '**වහාම**' යන්නය. **'පරාටේ ඇස්කිසිය'** යනු අධිකරණයේ ආධාරය අපේක්ෂා නොකොට, උකස් කළ දේපල විකුණා ණය ආපසු අය කරගැනීම සඳහා උකස් හිමියාට බලය ලබාදෙන ණය ආපසු අය කරගැනීමේ ක්‍රියාවලියකි.

---

**මාතෘකාව : ප්‍රගති පරීක්ෂණය සඳහා පිළිතුරු**
**පිටු අංක : 202**

*ප්‍රගති පරීක්ෂණයේ ප්‍රශ්න අංක 3 හි පිළිතුර පහත පරිදි සවිස්තරාත්මක දක්වා ඇත.*

**ප්‍රශ්නය**

3. 1990 අංක 4 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ මුල්‍ය ආයතනයක් මගින් සිදුකරනු ලබන "පරාටේ ඇස්කිසිය'' යන්නෙන් අදහස් වන්නේ කුමක්දැයි ලුහුඩින් **සඳහන් කරන්න.**

**පිළිතුර**

3. 'පරාටේ ඇස්කිසිය' යනු අධිකරණයේ නඩු පැවරීමකින් තොරව උකස් කළ දේපළ විකිණීමට බලය උකස් හිමියා වෙත ලබාදෙන ණය ආපසු අයකරගැනීමේ ක්‍රියාවලියකි.

All Rights Reserved

# පරිච්ඡේදය 9 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන කම්කරු නීතිය

**මාතෘකාව : 2.5 මාතෘ ප්‍රතිලාභ**
**පිටු අංක : 208**

*ඉහත 2.5 මාතෘකාවට පහත නිර්වචනය එකතුවිය යුතුය.*

දරු ප්‍රසූතිය යන්න පනත පහත පරිදි නිර්වචනය කොට තිබේ.

- දරුවා ජීවත්ව සිටියත් මියගියත් දරු ප්‍රසූතිය සඳහා දරනු ලබන ප්‍රසව ශ්‍රමය

- ගර්භණී කාලයේ සිට අවම වශයෙන් සති 28 ක කාලයක් තුළ කලලය ප්‍රසූත කිරීම

---

**මාතෘකාව : 2.5.2 දරු ප්‍රසූතියෙන් පසුව**
**පිටු අංක : 208**

*ඉහත මාතෘකාව යටතේ පහත නිර්වචනය ඇතුලත් කළ යුතුය.*

**ප්‍රසූති නිවාඩු**

- සජීවී දරු උපත් සිදුවන අවස්ථාවල පළමු හා දෙවන දරු උපත් සඳහා දවස් 84 ක්.

- සෙසු දරු උපත් සඳහා දවස් 42 ක්, එනම් එම දරු උපත්වල දරුවන් සජීවී ද නැද්ද යන්න නොතකා දවස් 42 ක කාලයක්.

දරු උපත අපේක්ෂා කරන අයට ඉහත සඳහන් දින 84 ක හෝ 42 ක ප්‍රසූති නිවාඩුව පහත 2.5.1 හා 2.5.2 උප ඡේද යටතේ විස්තර කොට තිබෙන ආකාරයට දරු ප්‍රසූතියට පෙර හෝ පසු ලබාගැනීමේ අභිමතය ඇති අතර එසේ නැතිනම් සම්පූර්ණ ප්‍රසූති නිවාඩුව දරු ප්‍රසූතියෙන් පසු ලබාගැනීමේ අභිමතය තිබේ.

ඉහත සඳහන් කළ දින 84 හෝ 42 ට ප්‍රසූතිය සිදුවන දිනය ද ඇතුලත්ය.

*2.5.2 අනු මාතෘකාව යටතේ එන පහත 'සටහන' ඉවත් කල යුතුයි.*

**සටහන:**

ඉහත සඳහන් කළ දින 70 හා 28 කාලසීමාවට දරු ප්‍රසූතිය සිදු වූ දිනය ද ඇතුළත්ය.

All Rights Reserved 

**මාතෘකාව : 4.1 පනතේ අදාලත්වය**
**පිටු අංක : 215**

*ඉහත මාතෘකාව යටතේ වන පළමු ඡේදය පහත පරිදි සවිස්තරාත්මක දක්වා ඇත.*

**4.1 පනතේ අදාලත්වය**

අමාත්‍යවරයා විසින් ස්වකීය නියෝගයක් මගින් තීරණය කොට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආකාරය අනුව මෙම පනතේ විධිවිධාන රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ කවර හෝ පංතියක හෝ ප්‍රවර්ගයකට අයත්වන ඕනෑම රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ ආයතනයකට අදාළ වනු ඇත.

---

**මාතෘකාව : 4.4 සාමාජිකයෙක් / සේවකයෙක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලෙන් මුදල් ආපසු ගැනීම**
**පිටු අංක : 216**

*දෙවන කරුණ පහත ආකාරයට වෙනස් විය යුතුය.*

- සේවකයා 60 හැවිරිදි වියට පත් වූ විට හා ඔහුගේ හෝ ඇයගේ සේවය අවසන් වූ පසු.

All Rights Reserved

# පරිච්ඡේදය 10 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන

# ව්‍යාපාර පරිසරය සහ නව රෙගුලාසි වලට අදාළවන වැරදි

**මාතෘකාව : 2.3 මුදල් විශුද්ධිකරණය සඳහා දඬුවම්**
**පිටු අංක : 229**

*ඉහත මාතෘකාව යටතේ කරුණු පහත පරිදි සංශෝධනය විය යුතුය.*

මහාධිකරණය විසින් මුදල් විශුද්ධිකරණය සඳහා වරදකරු ලෙස තීරණය කරන කවර හෝ පුද්ගලයෙක් පහත කී දඬුවම්වලට යටත් වේ.

- දේපොලෙහි වටිනාකමට වඩා අඩු නොවූ හා දේපොලෙහි වටිනාකම මෙන් තුන් ගුණයකට වැඩි නොවූ වටිනාකමක් සහිත දඩයක් හෝ
- වසර 5 - 20 අතර කාලයක සිර දඬුවමක් හෝ
- දඩයක් හා සිර දඬුවම යන දෙකම.

---

**මාතෘකාව : 2.5 මෙම පනත අදාළ වන්නේ කවුරුන් සඳහාද?**
**පිටු අංක : 229**

*ඉහත මාතෘකාව යටතේ අන්තර්ගතය පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

පහත දැක්වෙන පාර්ශවයන්ට මෙම පනත අදාල වේ.

- මෙම පනත යටතේ වරදක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ ක්‍රියාවක් සිදුකරන ශ්‍රී ලංකාවේ වාසය කරන ඕනෑම පුද්ගලයෙක්
- පනත විසින් වරදක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ ව්‍යාපාරයක් ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සංස්ථාපනය කරනු ලැබූ ඕනෑම ආයතනයක්
- මෙම පනත යටතේ වරදක් වන ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන ඕනෑම ක්‍රියාවක්

**මාතෘකාව : 3.3 විමර්ශන**
**පිටු අංක : 231**

*ඉහත මාතෘකාව යටතේ අන්තර්ගතය පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

**3.3 පරිගණක අපරාධ පිළිබඳ විමර්ශන කිරීම**

පරිගණක අපරාධ පිළිබඳ විමර්ශන කටයුතු සාමාන්‍යයෙන් සිදුවන්නේ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේය. පනතේ දෙවන කොටසේ එලෙස විමර්ශන සිදුවිය යුතු ක්‍රමවේදය දක්වා තිබෙන අතර එය කෙටියෙන් පහත විස්තර කෙරේ.

මෙම පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ දී පොලිසියට සහය වීම සඳහා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව හෝ මෘදුකාංග තාක්ෂණය පිලිබඳ නිසි සුදුසුකම් හා පළපුරුද්ද සහිත මහජන නිලධාරියෙක් පත් කිරීමට විෂය භාර අමාත්‍යවරයාට බලය තිබේ. එලෙස පත්කරනු ලැබෙන පුද්ගලයා පනතෙහි 'විශේෂඥයා' ලෙස හඳුන්වයි.

පනත යටතේ විමර්ශන සිදුකිරීමේ දී විශේෂඥයා වෙත යම් යම් බලතල පැවරී ඇත.

- පොලිස් නිලධාරියෙක් සමග ඕනෑම පරිශ්‍රයකට ඇතුළු වීම (අදාළ පොලිස් නිලධාරියා උප පොලිස් පරීක්ෂකවරයෙක්ට නොඅඩු නිලයක් උසුලන්නෙක් විය යුතුය)
- යම් තොරතුරු පද්ධතියක්, පරිගණකයක් හෝ පරිගණක පද්ධතියක් හෝ ඕනෑම වැඩසටහනක් හෝ එවැනි පරිගණකයක තිබෙන දත්ත හෝ තොරතුරු වෙත ප්‍රවේශ වීම.
- පිවිසුම් දත්ත අනාවරණය කරන ලෙස ඕනෑම පුද්ගලයෙක්ගෙන් ඉල්ලා සිටීම.
- ඕනෑම පුද්ගලයෙක්ගෙන් වාචිකව ප්‍රශ්න කිරීම.
- මෙම පනතේ පරමාර්ථයන් වෙනුවෙන් සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි වෙනත් ක්‍රියාමාර්ග ගැනීම.

මහේස්ත්‍රාත්වරයෙක් විසින් නිකුත් කරනු ලැබූ වරෙන්තුවක් මගින් ලබන අධිකාරිය මත, විශේෂඥයෙක්ට හෝ පොලිස් නිලධාරියෙක්ට පහත ක්‍රියාමාර්ග ගත හැකි බව පනත දක්වයි.

- ඕනෑම සේවා සපයන්නෙක් සතුව පවතින අනුසන්කරුවන් පිළිබඳ තොරතුරු (subscriber information) හෝ පිවිසුම් දත්ත ද ඇතුලත් ඕනෑම තොරතුරක් ලබාගැනීම.
- අනුසන්කරුවන් පිළිබඳ තොරතුරු හා පිවිසුම් දත්ත ද ඇතුලත්ව සන්නිවේදන ක්‍රියාවලියේ ඕනෑම අදියරක දී සිදුවූ රැහැන්ගත හෝ ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක් අන්තර් නිරෝධනය ( intercept) කිරීම.

කෙසේ වුවද පහත දැක්වෙන අවස්ථාවල දි වරෙන්තුවක් රහිතව වුවද ඉහත කී ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව උක්ත නිලධාරීන් සතුවේ.

- විමර්ශනය පිළිබඳ අවශ්‍යතාවය හදිසි නම්
- සාක්ෂි නැති වීමේ, විනාශ කිරීමේ, වෙනස් කිරීමේ හෝ ඒවාට ප්‍රවේශ විය නොහැකි පසුබිමක් ඇති කිරීමේ අවදානමක් තිබෙන විට
- විමර්ශනයට අදාල රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවයක් පවතී නම්.

All Rights Reserved

යම් පරිගණකයක් නීත්‍යනුකූල ව්‍යාපාරයකට අදාළ සාමාන්‍ය පරිචය තුළ කරනු ලබන කටයුතුවලට බාධාකාරී නොවන ලෙස ස්වකීය විමර්ශනය සිදුකිරීමට සෑම පොලිස් නිලධාරියෙක් හා විශේෂඥයෙක්ම වගබලා ගතයුතුය.

නීතිය විසින් දක්වා තිබෙන ක්‍රමවේදයට අනුකූලව විමර්ශනයට භාජනය වන පරිශ්‍රය තුළ ප්‍රවේශය පවතින ඕනෑම තොරතුරක් අත්අඩංගුවට ගැනීම, සෝදිසි කිරීම හෝ භාරයට ගැනීම සම්බන්ධයෙන් පොලිස් නිලධාරියෙක්ට බලය ඇත.

විමර්ශනයක් සඳහා සහයෝගය දීම උදෙසා ඕනෑම තොරතුරක් අනාවරණය කළ යුතු යම් පුද්ගලයෙක් වේද, එකී අවශ්‍යතාවයට අනුව කටයුතු කිරීමට සහය දීම ඔහු අනිවාර්යයෙන් කළ යුතුය.

පනත යටතේ විමර්ශන කටයුතු සිදුකරන සෑම පුද්ගලයෙක්ම, විමර්ශනය අතරතුර ඔහුට දැනගැනීමට ලැබෙන සියළුම තොරතුරු සම්බන්ධයෙන් දැඩි ලෙස රහස්‍යභාවය ආරක්ෂා කළ යුතුය.

---

**මාතෘකාව : 4.5 සහතික කිරීමේ බලාධිකාරය**
**පිටු අංක : 234**

*ඉහත මාතෘකාව යටතේ අන්තර්ගතය පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

මෙම පනත තුළ සහතික කිරීමේ අධිකාරිය ස්ථාපිත කිරීම හා සම්බන්ධ විධිවිධාන ඇතුලත්ය. මෙම පනතේ එන ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ වගකීම එම අධිකාරියට පැවරේ. අවසරලත් සහතික කිරීමේ සේවා සපයන ආයතන විසින් සහතික කිරීමේ සේවා සැපයීම නිසි ලෙස සිදුකිරීම සම්බන්ධයෙන් වගබලා ගැනීමේ බලය ද සහතික කිරීමේ අධිකාරිය සතුව තිබේ.

All Rights Reserved 

**මාතෘකාව : 5.3.2 ප්‍රකාශන අයිතියක් බලපවත්නා කාලය**
**පිටු අංක : 236**

*ඉහත මාතෘකාව යටතේ අන්තර්ගතය පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

'ප්‍රකාශන අයිතියක් ලියාපදිංචි කළ විට, කර්තෘගේ ජීවිත කාලය පුරාවට හා කර්තෘගේ මරණය සිදුවූ දිනයෙන් පසු වසර හැත්තෑවක ඉදිරි කාලයක් සඳහා එම ප්‍රකාශන අයිතිය ආරක්ෂා වේ' යන්න සාමාන්‍ය රීතියයි.

කෙසේ වුවද මෙම රීතියට ව්‍යතිරේඛ ඇත.

(i). හවුල් කර්තෘත්වයක් පවතින අවස්ථාවක, ජීවත්ව සිටින අවසාන කර්තෘගේ ජීවිත කාලය පුරාවට හා ඔහුගේ මරණය සිදුවූ දිනයෙන් පසු වසර හැත්තෑවක ඉදිරි කාලයක් සඳහා එම ප්‍රකාශන අයිතිය ආරක්ෂා වේ.

(ii). සාමූහික කෘතියක් සම්බන්ධයෙන් ( ව්‍යවහාරික කලා කෘති හැරුණු විට) සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය කෘතියක් සම්බන්ධයෙන් ගත් කළ, කෘතිය පළමුව ප්‍රකාශයට පත්කළ දිනයේ සිට වසර හැත්තෑවක ඉදිරි කාලයකට හෝ ප්‍රකාශ කරනු නොලැබූ කෘතියක් නම් කෘතිය නිර්මාණය කළ දිනයේ සිට වසර හැත්තෑවක ඉදිරි කාලයකට ප්‍රකාශන අයිතිය ආරක්ෂා වේ.

(iii). නිර්නාමිකව හෝ ව්‍යාජ නමක් යටතේ ප්‍රකාශ කරනු ලැබූ කෘති සම්බන්ධයෙන්, කෘතිය පළමුව ප්‍රකාශයට පත්කළ දිනයේ සිට වසර හැත්තෑවක ඉදිරි කාලයකට ආරක්ෂාව පවතී. එහෙත් වසර හැත්තෑව ගෙවී යාමට පෙර කර්තෘගේ අනන්‍යතාවය හෙළිදරවු වී නම් ඉහත 1 හෝ 11 යටතේ දැක්වූ නීතිමය තත්වයන්ගෙන් ගැලපෙන නීතිමය තත්වය එම අවස්ථාවට අදාළ වේ.

(iv). ව්‍යවහාරික කලා කෘති සම්බන්ධයෙන් ගත් විට එවැනි කෘතියක් නිර්මාණය කළ දිනයේ සිට වසර විසි පහක ඉදිරි කාලයක් දක්වා ආරක්ෂාව පවතී.

ඉහත දැක්වූ කාල සීමා, අදාළ කාල සීමාව කල් ඉකුත් වීමේ කොන්දේසියට යටත්ව, යම් කැලැන්ඩර් වර්ෂයක අවසානය දක්වා අදාළ වේ.

All Rights Reserved 

**මාතෘකාව : 5.5 පේටන්ට් බලපත්‍ර**
**පිටු අංක : 237**

*ඉහත මාතෘකාව යටතේ අන්තර්ගතය පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

''තාක්ෂණික ක්ෂේත්‍රයේ යම් නිශ්චිත ප්‍රශ්නයකට විසඳුමක් අභ්‍යාස කිරීම සඳහා උපකාර කරන නිමැවුම්කරුවෙක්ගේ අදහසක්'' ලෙස සහ තවදුරටත් ''නිමැවුමක්, නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් විය හැක. එසේත් නැතිනම් නිෂ්පාදනයකට හෝ ක්‍රියාවලියකට සම්බන්ධ විය හැකි'' ලෙස නිපැයුමක් යන්න පනත තුළ නිර්වචනය වී තිබේ.

ශබ්ද කෝෂ විසින් අර්ථ දක්වන ආකාරයට පේටන්ට් බලපත්‍රයක් යනු යම් නිශ්චිත වසර ගණනකට අදාළව තමන්ගේ නිපැයුම විකිණීමට නිමැවුම්කරුවෙක්ට ලැබෙන නිල නීත්‍යනුකූල අයිතියයි. අදාළ නිපැයුම නවතාවයෙන් යුක්ත නම්, එය තුළ නවෝත්පාදනීය පියවරක් අන්තර්ගත වේ නම් හා කාර්මික වශයෙන් භාවිතා කළහැකි වේනම් නිපැයුම්කරුවෙක්ට ස්වකීය නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමේ අයිතිය ලැබේ.

අදාළ නිපැයුම පිළිබඳ සෑහීමට පත්වේනම් අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කොට එය පේටන්ට් නාමාවලියේ සටහන් කරනු ඇත. මෙම නාමාවලිය ප්‍රසිද්ධ ලේඛනයක් වන අතර ඕනෑම පුද්ගලයෙක්ට එය පරීක්ෂා කර බැලිය හැක.

වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව ගෙවීමට යටත්ව, ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ දින සිට වසර විස්සක කාලයක් දක්වා පේටන්ට් බලපත්‍රයක් වලංගු වේ. (පනතේ 83.2 වගන්තිය)

පේටන්ට් බලපත්‍රය ලැබුණු නිපැයුමට අදාලව යම් නිශ්චිත හා අනන්‍ය අයිතිවාසිකම් සමූහයකට පේටන්ට් හිමිකරු හිමිකම් ලබයි. ඒවා නම්,

- පේටන්ට් බලපත්‍ර ලැබුණු නිපැයුම භාවිතා කිරීම
- පේටන්ට් බලපත්‍රය පැවරීම හෝ හුවමාරු කිරීම
- බලපත්‍ර සඳහා වූ ගිවිසුම්වලට ඇතුලු වීම (5.6.4 කොටස පිටු අංක : 237)

---

**මාතෘකාව : 6.3 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ප්‍රධාන කර්තව්‍යය සහ බලතල**
**පිටු අංක : 241**

*තරඟ විරෝධී චර්යා හි නිර්වචනය පහත පරිදි සංශෝධනය විය යුතුය.*

තරඟ විරෝධී චර්යා යනු ව්‍යාපාරික කටයුත්තක කොටසක් ලෙස, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හා සේවාවලට අදාලව පවතින තරඟකාරීත්වය වැලැක්වීමේ බලපෑමක් ඇතිකළ හැකි, යම් හැසිරීමක් අනුගමනය කිරීමය.

All Rights Reserved 

**අනු මාතෘකාව : අනෛතිකතාව**
**පිටු අංක : 246**

*ඉහත මාතෘකාව යටතේ අන්තර්ගත* **'අනෛතිකතාව'** *පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

- **අනෛතිකතාව**

මෙම විත්තිවාචකය *"ex turpicausa non orituractio"* නම් වූ ලතින් ආප්තය මත පදනම් වූවකි. නීති ශබ්ද කෝෂ අනුව එහි අර්ථය - යම් අයෙක් නීති විරෝධී කටයුතුවල නියුක්ත වේ නම්, එම නීති විරෝධී කටයුත්ත තුළින් ව්‍යුත්පන්න වන අලාභයක් ඉල්ලා වෙනත් පුද්ගලයෙක්ට එරෙහිව නඩු පැවරීම සිදුකළ නොහැකි බවයි.

All Rights Reserved

# පරිච්ඡේදය 11 – අතිරේක අන්තර්ගතය සහ සංශෝධන අන්තර්ජාතික වෙළඳාම

**මාතෘකාව : 1.2.2 සී.අයි.එෆ් (CIF) ගිවිසුම්**
**පිටු අංක : 255**

*1.2.2 සී.අයි.එෆ් ගිවිසුම් යටතේ එන* ***'සී.අයි.එෆ් ගිවිසුමේ අඩංගු මිලට පහත සඳහන් පිරිවැය වර්ග ඇතුළත් වේ.'*** *යන කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.*

සී.අයි.එෆ් ගිවිසුමේ අඩංගු මිලට පහත සඳහන් පිරිවැය වර්ග ඇතුළත් වේ.

- භාණ්ඩ පිරිවැය
- රක්ෂණ පිරිවැය
- ප්‍රවාහන පිරිවැය

---

**මාතෘකාව : 1.2.2 සී.අයි.එෆ් (CIF) ගිවිසුම්**
**පිටු අංක : 255**

***සී.අයි.එෆ්.ගැනුම්කරුවකුගේ කාර්යභාරය*** *යන ශීර්ෂය යටතේ කරුණු පහත පරිදි සවිස්තරාත්මකව දක්වා ඇත.*

- විකිණුම් ගිවිසුම සමග අනුකූල වේ නම් නැවුගත කිරීමට අදාළ ලියැවිලි භාරගැනීම
- ලියැවිලි ලැබුණු පසු භාණ්ඩ සඳහා වූ මිල ගෙවීම. භාණ්ඩ පරීක්ෂා කළාට පසු මිල ගෙවීම කල් දැමීම ඔහුට කළ නොහැක.
- විකිණුම් ගිවිසුමට අදාළ ප්‍රවාහන පිරිවැය දැරීම.
- නෞභාර පත්‍රයට අනුව ගමනාන්ත වරායේදී බඩු බෑමට වැයවන වියදම, බත්තල් ගාස්තුව සහ බිම් කුලී ගෙවීම.
- ආනයන බදු සහ රේගු ගාස්තු ගෙවීමට ඇත්නම් ඒවා ගෙවීම.

---

**උප මාතෘකාව : 5.2 සමථකරණය**

**පිටු අංක : 265**

5.2 අනු මාතෘකාවට පහත කොටස් එකතු විය යුතුය.

සමථකරණයට අදාළ පැතිකඩ දෙකක් තිබේ.

1. සාමාන්‍ය සමථකරණය
2. සමථ මණ්ඩල පනත යටතේ වූ සමථකරණය

All Rights Reserved

**මාතෘකාව : 5.2.2 සමථකරණ ක්‍රියාවලිය**
**පිටු අංක : 265**

*මෙම මාතෘකාව පහත පරිදි සංශෝධනය විය යුතුය.*

5.2.2 සමථකරණ ක්‍රියාවලිය - සාමාන්‍ය වශයෙන්

---

**උප මාතෘකාව : 5.2.3 අනිවාර්ය සමථකරණය**

**පිටු අංක : 266**

5.2.3 අනු මාතෘකා යටතේ වූ කොටස් පහත කොටස් මගින් විස්ථාපනය විය යුතුය.

**සමථ මණ්ඩල පනත යටතේ සමථකරණය**

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත හා ඊට අදාල සංශෝධන විසින් ලංකාව තුළ සමථකරණයට අදාල නීතිය පාලනය කරයි. සමථ මණ්ඩල පිහිටුවීම සඳහා වූ විධිවිධාන පනත තුළ අන්තර්ගත අතර එම මණ්ඩලවල බලතල හා කාර්යයන් ද පනතේ දක්වා ඇත.

පනතේ දක්වා තිබෙන කවර හෝ ආරවුලක් හෝ වරදක් සම්බන්ධයෙන් සමථකරණය හරහා විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඕනෑම පුද්ගලයෙක්ට සමථ මණ්ඩලයේ සභාපතිවරයාට අයැදුමක් ඉදිරිපත් කළ හැක. මෙම වරද සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් එම නිශ්චිත සමථ මණ්ඩලයට අදාල ප්‍රදේශය තුළ සිදුවූවක් විය යුතුය.

ආරවුලේ එක් පාර්ශවයක් පහත කවර හෝ පාර්ශවයකින් සමන්විත වේ නම් සභාපතිවරයා විසින් එබඳු අයැදුමක් පිළිගැනීම නොකළ යුතුය.

අ) රජය හෝ

ආ) ආරවුල යම් දේපලක්, මුදල් හෝ වෙනත් ගෙවිය යුතු යමක් අත්පත් කරගැනීම සම්බන්ධ වූවක් නම් ස්වකීය ධූරයේ පරාසය තුළ ක්‍රියාකරන රජයේ නිලධාරියෙක්

ඇ) නීතිපතිවරයා විසින් ක්‍රියාමාර්ග ගත යුතුව තිබෙන වරදක් සම්බන්ධයෙන් වන විට නීතිපතිවරයා

තවදුරටත් පනතේ 7 වන වගන්තිය සඳහන් කරන්නේ වටිනාකම රු. 250000 ට වඩා අඩු වූ කවර හෝ ආරවුලක් පනත යටතේ සමථකරණය සඳහා යොමුකළ යුතු බවය. එම ආරවුල සමථකරණය තුළින් විසඳිය නොහැකි නම් එම ආරවුල මත අධිකරණයේ නඩු පැවරීමට නම් සමථ මණ්ඩලය විසින් 'නිරාකරණය නොවූ බවට' නිකුත් කරන සහතිකය අධිකරණයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ.

All Rights Reserved